මාධ්‍ය නිවේදන අංක 06

මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව විසින් සංවිධානය කරනු ලබන 2022 වර්ෂයේ ඡන්ද හිමියන්ගේ දින ජාතික උත්සවය 2022.03.11 දින ප.ව. 3.30 ට අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු කථානායකතුමා, ගරු විපක්ෂනායකතුමා, මැතිවරණ නීති සංශෝධනය පිණිස පත් කරන ලද විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සභාපතිතුමා, සියළුම දේශපාලන පක්ෂ ලේකම්වරු, රාජ්‍ය නිලධාරීන්, මැතිවරණ නිලධාරීන්, තානාපති නිලධාරීන්, සිවිල් සංවිධාන ඇතුළු මැතිවරණ කොමිෂන් සභාවේ සියලුම පාර්ශ්වකාර කණ්ඩායම්වල සහභාගීත්වයෙන් කොළඹ ගලධාරී හෝටලයේ දී පැවැත්වේ. මෙම ජාතික උත්සවයේ අරමුණ පැහැදිලි කිරීම හා පිළිගැනීමේ කථාව මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් සිදු කෙරේ. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් ඡන්දහිමියන්ගේ දිනය හා මැතිවරණ නීති සංශෝධනවල කාලීන අවශ්‍යතාව මෙන්ම ඒවායේ වැදගත්කම අලලා විශේෂ දේශනයක් පවත්වනු ඇත. එසේම ගරු අග්‍රාමාත්‍යතුමා හා සභානායකතුමාගේ විශේෂ දේශන ද මෙම වැඩසටහනට ඇතුළත් වන අතර "ඡන්ද අයිතිය සහ තරුණ ප්‍රජාවගේ වගකීම්" යන මැයෙන් වූ මෙම ජාතික උත්සවයේ මුඛ්‍ය දේශනය රුහුණු විශ්ව විද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මැතිතුමා විසින් පවත්වනු ලැබේ. එසේම මෙම ජාතික උත්සවය හා සමගාමීව පරමාධිපත්‍යය, සර්වජන ඡන්ද බලය හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව සාකච්ඡා කෙරෙන විද්වතුන්ගේ ලිපි ඇතුළත් ලිපි සංග්‍රහයක් එළිදැක්වේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

2022.03.11